# 4 ශ්‍රේණිය සිංහල
# ගුරු අත් පොතට
# වැඩ පොත - අංක 05

## L3, S3, R3, W3
## නිපුණතා ආවරණය - 2021



සරල ජේදයක් ළමා කවි, ගීතවලට සවන් දී ඒ පිළිබඳ ව කතා කරයි.

- ළමා කතන්දර, සංවාදවලට සවන් දී එහි අන්තර්ගතය ප්‍රකාශ කරයි.
- චරිතය පිළිබඳ අවබෝධයෙන් යුතු ව කතා කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- ළමා කවි, ගීත, කතන්දර හා සංවාද කියවා ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.
- චරිතයකට ආරෝපණය වී අවබෝධයෙන් යුතුව කියවයි./ලියයි.
- චිත්‍ර කතා කියවා, නිර්මාණශීලී දෙබස් ලියයි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

For Online Class details WhatsApp 071-9020298

# 4 ශ්‍රේණිය මව්බස (සිංහල)

# $L_3$ $S_3$ $R_3$ $W_3$ ඉගෙනුම් පල

- ළමා කවි, ගීතවලට සවන් දී ඒ පිළිබඳ ව කතා කරයි.
- ළමා කතන්දර, සංවාදවලට සවන් දී එහි අන්තර්ගතය ප්‍රකාශ කරයි.
- චරිතය පිළිබඳ අවබෝධයෙන් යුතු ව කතා කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- ළමා කවි, ගීත, කතන්දර හා සංවාද කියවා අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.
- චරිතයකට ආරෝපණය වී අවබෝධයෙන් යුතුව කියවයි./ලියයි.
- චිත්‍ර කතා කියවා, නිර්මාණශීලී දෙබස් ලියයි.

## ළමා කවි.

- පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

### සරු පොළොවක් අපට ඇතේ

මහගම සේකර

වෙරළ වටා මුතුපර වැටියයි
ඉන්දිය සයුරේ මුතු ඇටයයි
පාට පාට මැණික් ජාති
පසට යටින් කැටි වේ
රත්නදීප පොළොව තුළින්
ධන නිධාන මතු වේ
මහවැලි නිල්වලා ගඟයි
කළු වලවේ කැලණි ගඟයි
ගමින් ගමට ගලා ගොසින්
ගොඩයි මඩයි පොහොර කරයි
පලා පැහැය හැම කල්හි ම
රැඳී දිලෙන පොළොවේ
ඉවත දමන දඬුව වුව ද
දලු ලා යළි පැළ වේ

සීගිරියේ ලෙන් දොරකඩ
සිටින සුරංගනාවෝ
දෝත පුරා මල් අරගෙන
අපට සුවඳ ගෙනාවෝ
නිල් පලසක් එළුවා සේ
රුහුණු රටේ වෙල් යායයි
පිය ගැට පෙළ කැපුවා සේ
උඩරට පොඩි ලියදි පෙළයි
දුන්හිඳ දියලුම ඇලී
ගලින් ගලට හැලි හැලී
සිහින් සිහිඳු දේදුනු මැද
මුතුවැල් වරුසා වසී
ඉරු දෙව් මුහුදින් ඇදී
සමනොළ කන්දට වඩී
එතකොට මුළු ලංකාවම
දිලිහෙයි ලස්සන වෙච්

1. පසට යට වී ඇත්තේ මොනවා ද ?

...................................................................................................................................

2. පොළොවේ සරුසාරවත් බව පිළිබඳ කියවෙන කවිය කුමක් ද ?

...................................................................................................................................

...................................................................................................................................

3. රුහුණු රටේ වෙල් යාය කවියේ හඳුන්වා ඇත්තේ කුමන ලෙසින් ද ?

...................................................................................................................................

4. කවි පෙළෙහි සඳහන් දිය ඇලි දෙක නම් කරන්න.

...................................................................................................................................

5. ඉන්දීය සයුරේ මුතු ඇටය ලෙසින් හඳුන්වා ඇත්තේ කුමක් ද ?

..........................................................................................................................................

6. පොළොව තුළින් මතු වන ධන නිධාන මොනවා ද ?

..........................................................................................................................................

7. ගමින් ගමට ගලා යන්නේ කුමන ගං!ගා ද ?

..........................................................................................................................................

8. පලා පැහැය හැම කල්හි ම යන කවියේ අර්ථය ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

9. රටේ අසිරිය පිළිබඳ ව වාක්‍ය 4ක් ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

## ළමා ගීත.

- පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

අක්කෙ අක්කෙ අර බලන්නකෝ - වැස්සක් නොවැ එන්නේ //
හෝ හෝ හෝ ගා ගෙන එන්නේ - ගස් ගල් පෙරළෙන්නේ

සුළං තදයි විදුලිය ද කොටයි - හෙණ හඬ පැතිරෙයි
මහ වලාකුළක් මේ එන්නේ

අක්කේ වී පැදුරත් මිදුලේ - අකුළා ගෙට ගන්නේ //
අම්මත් අර නාගෙන එන්නේ - මල්ලි තව ම කුඹුරේ

සුළං තදයි . . .

නංගි සුදෝ මගෙ අඬන්නෙපා - අම්ම හණික දූන් එයි //
බිල්ලො නොවෙයි ඔය ගොරවන්නේ - අහසේ හෙණ නාදේ
සුළං තදයි . . .

අක්කේ දර ටික ගෙට ගනිමු - වැහි පොද වැටෙනවනේ //
වතුරත් ඉවර යි කළගෙඩියේ - හණික ළිඳට යමුකෝ

සුළං තදයි . . .

අක්කෙ අක්කෙ . . .

පද රචනය : ආනන්ද සමරකෝන්
ගායනය : සූර්ය ශංකර් මොල්ලිගොඩ සහ වි. පී. ලීලාවති

1. මෙම ගීතයෙන් කියවෙන්නේ කුමන අවස්ථාවක් පිළිබඳව ද ?

..........................................................................................................................................

2. වී පැදුර ගෙට ගන්න කියන්නේ කාට ද ?

........................................................................................................................................

3. නාගෙන එන්නේ කවරෙක් ද ?

........................................................................................................................................

4. කුඹුරේ සිටින්නේ කවරෙක් ද ?

........................................................................................................................................

5. පහත වචන නිවැරදි ව ගළපා වාක්‍ය සකස් කරන්න.

1. තදයි/ සුළං / කොටයි / විදුලිය ද

........................................................................................................................................

2. අහසේ / පාවෙයි / වලාකුළක් / මහ

........................................................................................................................................

3. පැදුර / වී / අකුළයි / අක්කා

........................................................................................................................................

4. හඬයි / බිය වී / නංගී

........................................................................................................................................

5. නාගෙන / එයි / ගෙදරට / අම්මා

........................................................................................................................................

6. වැඩ කරයි/ මල්ලී / කුඹුරේ

........................................................................................................................................

7. ටික / දර/ අපි / ගනිමු / ගෙට

........................................................................................................................................

8. යමු / හණික / අපි / ළිඳට

........................................................................................................................................

6. අක්කෙ අක්කෙ අර බලන්නකෝ ගීතය ඇසුරෙන් චිත්‍රයක් අඳින්න. අඳින ලද චිත්‍රයට ගැළපෙන වාක්‍ය 4ක් ලියන්න.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

## ළමා කතා.

- පහත සඳහන් කතාව කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

### ගල සහ කරත්තකරුවෝ

එක්තරා රාත්‍රියක කඳු මුදුන්වලට ඉහළින් වැහි වලාකුළු ඒකරාශී වන්නට විය. අහස ගුගුරවමින් ධාරානිපාත වැසි ඇද හැලෙන්නට පටන් ගත්තේය. අගල් දිය පහරවල් උතුරුවමින් මහ ගස් මුලින් උදුරා දමමින් ජලය ගලා යන්නට විය. කළු ගල් පර්වතයේ විශාල කොටසක් බිඳ දමමින් කැඩී ගිය කළු ගලක් පටු මාවත හරස් කරමින් අඳුරේ ම තෙත පොළව මත පතිත වී එහි රැඳුණි.

කුණාටුවට පසු දින උදෑසන ග්‍රීෂ්ම සෘතුවේ දීප්තිමත් හිරු එළියෙන් පරිසරය ම ආලෝකවත් විය. ගස්වල අතු අග රැඳී තිබූ ජල බිංදු විසිරී ගිය අතර මෙතෙක් වේලා බිම වැතිර සිටි තණකොළ යළි නැගී සිටියේ ය. ගමේ සිට පැමිණි කරත්තයක් පාරේ ගමන් කරනු දක්නට ලැබිණි. නැමී ගිය කළු අං ඇති මීහරක් දෙදෙනෙක් කරත්තය ඇදගෙන ආහ. කරත්තයේ බෝන් ලීය මත වාඩි වී සතුටින් ගී ගයමින් යන ගැමියෙකි. සිල්ලර කඩ හිමියකු වන හෙතෙම ලුණු සහ අනෙක් ද්‍රව්‍ය මිලට ගැනීමට නගරයට යමින් සිටියේ ය. විශාල ගල පෙරළී තිබූ ස්ථානයට පැමිණි විට ඔහුට නතර වීමට සිදු විය. පාර අවහිර වී ඇත. පාරේ වම් පැත්තේ බෑවුමකි. ඊට පහළින් පෙනෙනුයේ වේගයෙන් ජලය ගලා යන ගඟකි. දකුණු පැත්තේ විශාල කන්දකි. විශාල ගල දුටු ගැමියා තම බෙල්ල කසමින් කරත්තයෙන් බැස ගල වෙත ගියේ ය. ඔහු එය තල්ලු කිරීමට උත්සාහ කළේ ය. එහෙත් ඔහුට එය සෙලවීමවත් නොහැක.

''දෙවියනේ. රාත්‍රියේ කඩා වැටිල තියෙන්නේ මොනතරම් විශාල කළු ගලක් ද ? මට ඒක හොලවන්නවත් බෑ. මේක තල්ලු කරන්න පුළුවන් තරම් ශක්තිමත් කෙනෙක් එන කල් මම බලාපොරොත්තුවෙන් ඉන්නවා.'

ඔහු පාර අයිනේ වාඩි වී කෝටුවක් කඩාගෙන පොළොවේ ඉරි අඳින්නට විය. මඳ වේලාවකට පසු දර පුරවාගත් දෙවන කරත්තය පැමිණියේ ය. ඉණෙහි රතු පටියක් බැඳ සිටි කරත්තකරුවා කඩවසම් තැනැත්තෙකි. තුර්කි ජාතිකයෙකි.

'ආ . . . සහෝදරයා. පාර මැද කරත්තෙ නතර කරන් ඉන්නෙ ඇයි ? පොඩ්ඩක් කරත්තෙ පැත්තකට ගන්න. එතකොට මට යන්න පුළුවනි. මට හුඟක් හදිස්සි යි.'

'හුඟක් හදිස්සි යි ? මුලින් ම ඉස්සරහ තියෙන ගල පෙරළල දාන්න. ඉන් පස්සෙ ඉදිරියට යන්න පුළුවනි. සිල්ලර කඩ හිමියා පිළිතුරු දුන්නේ ය.'

'මොන ගලක් ද ?'

'ඇවිත් බලන්න. මගෙ මීහරක් දෙන්න ඉදිරිපිට තියෙන විශාල ගල දිහා බලන්න.'

කරත්තයෙන් බැසි තුර්කි ජාතිකයා විශාල ගල පරීක්ෂා කර බලා අනතුරු ව තම කබාය ගලවා පසෙකින් තබා විශාල ගල තල්ලු කිරීමට දැඩි උත්සාහයක් දැරුවේය. එහෙත් ගල යන්තමින් වත් නොසෙල්විණ.

ඔහු සිල්ලර කඩ හිමියා අසලින් ම වාඩි විය. නොබෝ වේලාවකින් කුලී රියක් පැමිණියේ ය. කුලී රථයේ රියදුරා ශක්තිමත් අත් පා ඇති අයෙකි. තමා ඉදිරියේ ඇති කරත්ත නවත්වා තිබෙන අයුරු දුටු හෙතෙම කෑ ගසන්නට පටන් ගත්තේ ය. අනතුරු ව කුලී රියෙන් බැස ගල වටා කැරකුණ නමුත් ඔහුටත් ගල සෙලවිය

නොහැකි විය. ඉනික්බිති ව සත්සුන් වූ හෙතෙම අනෙක් දෙදෙනා අසලින් වාඩි වී බලා සිටියේ ය. මඳ වේලාවකට පසු අශ්වයන් දෙදෙනකු විසින් ඇදගෙන යනු ලැබූ කරත්තයක් පැමිණියේ ය. එහි මැටි භාණ්ඩ තොගයක් වූ අතර ඒවා රෙද්දකින් වසා ඇත. ළඟ ම ඇති පොළට මැටි භාණ්ඩ ගෙන යාමට හදිස්සියක් දක්වූ එම රියේ ස්වාමියා තමන්ගේ ගමන් මාර්ගය අවහිර වී ඇති බව දැක දැඩි කනස්සල්ලට පත් වූයේ ය. ඔවුන් අතර සිටි එක් මිනිසෙක් ගලට දඬුවම් කරනු වස් තම කසයෙන් ගලට තළන්නට පටන් ගත්තේ ය. කරත්තකරුවෝ ඔහුට සිනාසුණහ. කාලය ගෙවී ගියේ ය. දිවා කාලය එළඹිණ. කරත්තකරුවෝ රැසක් ම එහි රැස් ව සිටියහ. ඔවුන් එකිනෙකා ගල ඉවත් කිරීමට වෙන වෙන ම උත්සාහ දැරුවත් කිසිවකුටවත් ගල සෙලවිය නොහැකි විය. මේ අතර මහල්ලෙක් පැමිණියේ ය. ඔහු ස්ට්‍රෝබෙරි කදක් කරේ තබා ගෙන ගමන් කළේය. සෙනඟ අතරට පැමිණි හෙතෙම කරත්තකරුවන්ට සුබ පතා තම ගමන යන්නට සැරසුණේ ය.

'ඔබට නම් පුළුවනි. ඔබට කරත්තයක් නැහැ නෙ. එනිසා ඔබට ගල පහුකරගෙන යන්න පුළුවනි. ගිහින් ඔබගෙ බෙරි ගෙඩිත් විකුණාගන්න පුළුවනි. මැටි භාණ්ඩ කරත්තය රැගෙන ගිය වෙළෙන්දා ඊර්ෂ්‍යාවෙන් පැවසුවේය.'

'ඔබටත් පුළුවනි.' මහල්ලා තමා අවට සිටි පිරිස දෙස බැලුවේ ය.

'අපි කොහොමද ගල පහුකරන් යන්නේ ?'

'ඒකට මොළේ පාවිච්චි කරන්න අවශ්‍යයි.'

'මෙතෙනට මොළය වගේ ම ශක්තියත් අවශ්‍යය යි.' මැටි භාණ්ඩ වෙළෙන්දා පැවසුවේය. 'අපි හැමෝ ම උත්සාහ කළා. ඒත් සාර්ථක වුණේ නැහැ.'

'එහෙම නම් ඔක්කොමල එකතු වෙලා ගල ඉවත් කරන්න උත්සාහ නොකරන්නේ ඇයි ? විශාල පිරිසක් මෙතන ඉන්නවා. හැමෝම එකතු වෙන්නෙ නැත්තේ ඇයි ? මාර්කෝ රජතුමා (වීර කතාවල එන රජෙක්) මිනීවළෙන් නැගිටලා ඇවිත් ගල ඉවත් කරන කම් බලා ඉන්නව ද ?. එහෙනම් හුඟ කලක් බලා ඉන්න වේවි.'

'ඒක ඇත්ත. කුලී රිය හිමියා පැවසුවේය. එන්න සහෝදරවරුනි, අපි ගල අයින් කරමු.'

කරත්තකරුවෝ ගල වටා රැස් වී විශාල උත්සාහයක් දරා ගල තල්ලු කළහ. පහත වූ පල්ලමට වැටුණු ගල මහ හඬක් නංවමින් පිපිරී ගියේ ය.

පාර නිදහස් වීමෙන් පසු කරත්තකරුවන්ට පහසුවෙන් තම ගමන යා හැකි විය.

පාසල් මිත්‍රයා හා තවත් බල්ගේරියානු යොවුන් කතා
සිංහල අනුවාදය - බොබී බී. බොතේජු

1. මේ කතාවේ එක් එක් චරිතය ගැන ඔබේ අදහස් කෙටියෙන් දක්වන්න.

- සිල්ලර කඩ හිමියා

..........................................................................................................................

..........................................................................................................................

- දර පුරවා ගෙන පැමිණි තුර්කි ජාතිකයා

..........................................................................................................................

..........................................................................................................................

- කුලී රථ රියදුරා

..........................................................................................................................

..........................................................................................................................

- මැටි භාණ්ඩ අයිතිකරු

.................................................................................................................................................

.................................................................................................................................................

- ස්ට්‍රෝබෙරි කඳක් රැගෙන පැමිණි මහල්ලා

.................................................................................................................................................

.................................................................................................................................................

2. ගැළපෙන වාක්‍ය කොටස වරහන් තුළින් ගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

(විශාල උත්සාහයක් දරා ගල තල්ලු කළහ./වැහි වලාකුළු ඒකරාශි වන්නට විය./ වෙන වෙන ම උත්සාහ දැරූහ./ අඳුරේ ම තෙත පොළොව මත පතිත වී රැඳුනි./ පාරේ ගමන් කරනු දක්නට ලැබීය.

1. එක්තරා රාත්‍රියක කඳු මුදුන්වලට ඉහළින්

.................................................................................................................................................

2. කළු ගලක් පටු මාවත හරස් කරමින්

.................................................................................................................................................

3. ගමේ සිට පැමිණි කරත්තයක්

.................................................................................................................................................

4. කරත්තකරුවෝ එකිනෙකා ගල ඉවත් කිරීමට

.................................................................................................................................................

5. කරත්තකරුවෝ ගල වටා රුස් වී

.................................................................................................................................................

3. කතාව ගොඩනැගෙන පරිදි වාක්‍ය අනුපිළිවෙළට අංකගත කරන්න.

- ස්ට්‍රෝබෙරි කඳක් කරේ තබා ගත් මහල්ලා සුබ පතමින් යන්නට සැරසුණේ ය. ( )
- අහස ගුගුරවමින් ධාරානිපාත වැසි ඇද හැලිණි. ( )
- සිල්ලර කඩ හිමියෙක් නගරයට යමින් සිටියේ ය. ( )
- කරත්තකරුවෝ ගල වටා රුස් වී විශාල උත්සාහයක් දරා ගල තල්ලු කළෝ ය. ( )
- කළු ගලක් පටු මාවත හරස් කරමින් පොළොව මත රැඳුණි. ( )
- කුලී රථයේ රියදුරා පැමිණ ඉදිරියේ ඇති කරත්ත නවතා තිබෙන අයුරු දැක කැගැසුවේ ය. ( )
- සැම දෙනා ම එකතු වී ගල ඉවත් කිරීමට උත්සාහ නොකරන්නේ ඇයි යනුවෙන් මහල්ලා ප්‍රශ්න කළේ ය. ( )
- ඉන් පසු දර පුරවා ගත් කරත්තකරු පැමිණියේ ය. ( )
- මැටි භාණ්ඩ පුරවා ගත් අශ්ව කරත්තයක් පැමිණියේ ය. ( )
- ගල පෙරළී තිබූ ස්ථානයට පැමිණි විට ඔහුට නතර වීමට සිදු විය. ( )